රජය හා ව්‍යාපාර

ව්‍යාපාර වලට රාජ්‍ය මැදිහත්වීම මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන හරහා සිදුවෙයි.

රජයක් ව්‍යාපාර වලට බලපෑම් කරන ආකාරය

1. ගනුදෙනුකරුවෙකු ලෙස
   රජයට අවශ්‍ය විවිධ භාණ්ඩ හා සේවා රජය, ව්‍යාපාරවලින් මිලදී ගැනීම තුළින් රජය ගනුදෙනුකරුවෙකු ලෙස ව්‍යාපාර වලට බලපෑම් කරයි. රජයට අවශ්‍ය කාර්යාල උපකරණ, හමුදාවන්ට අවශ්‍ය අවිආයුධ මෙන්ම කළමනාකරණ, උපදේශන, ඉංජිනේරු සේවාද මෙසේ ලබාගනියි.

2. තරඟකරුවෙකු ලෙස
   රජයද යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍රහි පෞද්ගලික අංශය හා තරඟකාරීව ව්‍යාපාර කටයුතු සිදු කරයි. ප්‍රවාහන කටයුතු, ගුවන්විදුලි, රූපවාහිනි නාලිකා, පුවත්පත් ඇතුළු සන්නිවේදන ක්ෂේත්‍රය, අධ්‍යාපන කටයුතු ආදිය මීට උදාහරණ වේ.

3. යටිතල පහසුකම් සපයන්නෙකු ලෙස
   මහාමාර්ග, විදුලිය, ජලය, වරාය, ගුවන්තොටුපළ වැනි යටිතල පහසුකම් සපයමින් ව්‍යාපාර සංවර්ධනයට රජය දැඩි බලපෑමක් සිදු කරයි.

4. නියාමකයෙකු ලෙස
   රටේ ව්‍යාපාර කටයුතු පරිපාලනය මෙන්ම සුපරීක්ෂණය රජය විසින් සිදු කරයි. මහබැංකුව, ප්‍රවාහන කොමිසම, මධ්‍යම පරිසර අධිකාරිය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ආදී ආයතන විශාල සංඛ්‍යාවක් මේ සඳහා පිහිටුවා ඇත.

5. දිරිගැන්වීම් සපයන්නෙකු ලෙස
   ව්‍යාපාර පවත්වාගෙන යාමට, පුළුල් කිරීමට, සංවර්ධනයට යම් යම් දිරිගැන්වීම් මූල්‍යමය මෙන්ම මූල්‍යමය නොවන වශයෙන් රජයක් විසින් සපයයි.

6. බදු අයකරන්නෙකු ලෙස
   රජයක් ව්‍යාපාරවලින් විවිධ බදු අයකරමින් ව්‍යාපාර වලට බලපෑම් කරයි. VAT බදු, ආදායම් බදු, නිෂ්පාදන බදු, ව්‍යාපාර ලාභ මත බදු, තීරු බදු ආදිය උදාහරණ වේ.

7. ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස
   ව්‍යාපාර වලට දැඩි ලෙස බලපාන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මධ්‍යම රජය විසින්ද, ව්‍යාපාර නාම ප්‍රඥප්ති, පරිසර ප්‍රතිපත්ති ආදී ප්‍රතිපත්ති පලාත් හා ප්‍රාදේශීය සභා මගින්ද ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහය හා මගපෙන්වීම වැදගත්වන ආකාරය

- ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම.
- කීර්තිනාමය වර්ධනය වීම.
- රටේ සංවර්ධනයට දායක වීම.
- රජයේ හා මහජනයාගේ පිළිගැනීම ඇති වීම.

රජයක ආර්ථික අරමුණු

1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය
   රටක මූර්ත ජාතික නිෂ්පාදිතය දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව ඉහළ යාම ආර්ථික වර්ධනය ලෙස හඳුන්වන අතර ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ රටේ සමස්ත ජනතාව වෙත බෙදීගොස් ඔවුන්ගේ ජීවන තත්වය ගුණාත්මකව ඉහළ යාම ආර්ථික සංවර්ධනය ලෙස හඳුන්වයි.

2. පූර්ණ සේවා නියුක්තිය
   රටක් සතුව පවතින වර්තමානයේ භාවිත කල හැකි සම්පත් පූර්ණ වශයෙන් හා ඵලදායිව නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීම සම්පත් පූර්ණ සේවා නියුක්තිය ලෙස හඳුන්වයි.

3. සාධාරණ අදායම් ව්‍යාප්තිය
   රටේ සමස්ථ නිමැවුම සාධාරණ පදනමක් මත රටේ ජනතාව අතර බෙදී යාම මෙයින් අදහස් වෙයි.

4. ආර්ථික ස්ථායිතාව
   රටේ ආර්ථිකය උච්ඡාවචනයකින් තොරව හෙවත් උද්ධමන හෝ අවධාමනකාරී තත්වයකින් තොරව පවත්වා ගැනීම ආර්ථික ස්ථායිතාව ලෙස හඳුන්වයි. අභ්‍යන්තර මිල ස්ථායිතාව සහ බාහිර මිල ස්ථායිතාව තුළින් ආර්ථික ස්ථායිතාව ඇති කර ගත හැකිය.

5. යහපත් අන්තර්ජාතික වෙළදාම
   ගෙවුම් ශේෂය තුලිතව පවත්වා ගනිමින් විදේශ වෙළඳ කටයුතු සතුටුදායක මට්ටමින් පවත්වා ගැනීම මෙයින් අදහස් කරයි.

රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර වල දායකත්වය

1. බදු ගෙවීම
   රජයට තම අදායම හෝ ලාභය මත ගෙවිය යුතු බදු මුදල් නිසි කලට වෙලාවට ගෙවීම තුළින් රජයේ කාර්යභාරය කරගෙන යාමට අවශ්‍ය අරමුදල් නිසිපරිදි සම්පාදනය වීම සිදුවේ.

2. සේවා නියුක්තියට දායක වීම
   ව්‍යාපාර සදහා අවශ්‍ය මානව සම්පත් සේවයට බදවා ගැනීම තුළින් සේවා නියුක්තියට දායක වීම රජයේ අරමුණු ඉටු කර ගැනීමට උපකාරී වෙයි.

3. දේශීය සම්පත් භාවිතය
   තම නිෂ්පාදන කටයුතු සදහා දේශීය සම්පත් භාවිත කිරීම නිසා ජනතාවගේ ජීවන තත්වය උසස් කල හැකි වීමත් ඒ තුළින් ආර්ථික සංවර්ධනයට මග පැදීමත් සිදු වීම.

4. රජයේ ප්‍රතිපත්ති හා නීතිරීති පිළිපැදීම
   රජයේ පිස්කල් හා මුල්‍ය ප්‍රතිපත්ති වලට අනුගතව කටයුතු කිරීම සහ ව්‍යාපාර සදහා පනවා ඇති නීතිරීති අනුව කටයුතු කිරීම

5. පරිසරයට වන හානිය අවම කිරිම
   තිරසර සංවර්ධනයක් උදා කර ගැනීම සදහා ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

<u>පිස්කල් ප්‍රතිපත්තිය</u>

රජයේ ආදයම් හා වියදම් සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය පිස්කල් ප්‍රතිපත්තියයි.

පිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ <u>සාර්ව ආර්ථික ස්ථායිතාව</u> පවත්වා ගැනීමයි.

රජය වෙනුවෙන් පිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනුයේ රජයේ භාණ්ඩාගාරය විසිනි.

<u>රාජ්‍ය අදායම</u>

රාජ්‍ය ආදයම ප්‍රධාන කොටස් දෙකකි.

1.බදු අදායම	2.බදු නොවන අදායම්
ප්‍රධාන කොටස් දෙකකි. **A.** <u>ඍජු බදු</u> • ආදයම් බදු • සමාගම් බදු • රඳවා ගැනීමේ බදු • ප්‍රාග්ධන ලාභ මත බදු **B.** <u>වක්‍ර බදු</u> ❖ VAT බදු ❖ රේගු බදු ❖ නිෂ්පාදන බදු	❖ ලාභ හා ලාභාංශ ❖ ගාස්තු හා අයකිරීම් උදා: මෝටර් රථ සඳහා ආදයම් බලපත්‍ර ගාස්තු අය කිරීම ❖ පොළී අදායම් ❖ සමාජ සංරක්ෂණ දායක මුදල් ❖ සේවා හා පරිපාලන ගාස්තු අයකිරීම්

- ඍජු බදු යනු පුද්ගලයන්ගේ ආදයම, ධනය හෝ දේපල මත අය කරන, ගෙවන පුද්ගලයා විසින්ම බදු බර දැරිය යුතුවන බදු වේ. එනම් බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන් කල නොහැකිය.
- වක්‍ර බදු යනු බදු බර විතැන් කල හැකි, එනම් බද්ද ගෙවන පුද්ගලයා විසින්ම බදුබර දැරි යුතු නොවන බදු ය. මෙම බදු රටේ උද්ධමනයට බලපායි.

<u>රජය විසින් පනවන බදු ව්‍යාපාර වලට බලපාන ආකාරය</u>

1. භාණ්ඩ හා සේවා මත පනවන බදු නිසා භාණ්ඩ වල මිල ඉහළ යාමෙන් ඉල්ලුම අඩු වී ලාභ අඩු වීම.
2. අමුද්‍රව්‍ය මිල ඉහළ යාමෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා භාණ්ඩ වල මිල ඉහළ යාම.
3. ව්‍යාපාරිකයාගේ ලාභ අඩු වන නිසා ප්‍රතිආයෝජනය අධෛර්යමත් වීම.
4. ව්‍යාපාරිකයාට අතිරේක වියදමක් හා කාලයක් දැරීමට සිදු වීම.
5. රට තුළ උද්ධමනයක් නිර්මාණය වීම.
6. ආනයනික භාණ්ඩ මත බදු පැනවීම මත දේශීය කර්මාන්ත ආරක්ෂා වීම.
7. අහිතකර පරිභෝජනය මෙන්ම අහිතකර ආයෝජනයන් පාලනය කල හැකි වීම.
8. ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම.

රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම ද ප්‍රධාන කොටස් දෙකකි.

1.වර්තන වියදම් (පුනරාවර්තන වියදම්)	2.ප්‍රාග්ධන වියදම්
රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සිදු කරන, වසරක් තුළ නැවත නැවත දැරිය යුතු වියදම් වර්තන වියදම් ලෙස හඳුන්වයි. උදාහරන ලෙස, • පොළී ගෙවීම් • ආරක්ෂක වියදම් • වැටුප් හා වේතන • මධ්‍යම රජයේ වියදම් • කුටුම්භ අංශය වෙත පැවරුම් • අනෙකුත් පැවරුම්	රජයක් විසින් දිගුකාලින ආයෝජන සඳහා දරන වියදම් වේ. මේවා වසරකට වඩා වැඩි කාලයක් සඳහා දරන, නැවත නැවත දැරීමට සිදු නොවන වියදම් ය. උදාහරණ ලෙස, • මහාමාර්ග • පාලම් • ගුවන්තොටුපළ • වරාය

පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය

1. **ආනයනික භාණ්ඩ මත බදු පැනවීම නිසා දේශීය ව්‍යාපාරිකයන් දිරිමත් වීම.**
2. **නිෂ්පාදන බදු පැනවීම හරහා ඇතැම් අහිතකර නිෂ්පාදන සීමා කල හැකි වීම.**
3. **භාණ්ඩ සේවා මත පනවන බදු නිසා මිල මට්ටම් ඉහළ යාමෙන් උද්ධමනකාරී තත්වයක් නිර්මාණය වීමට ඇති හැකියාව.**
4. **යටිතල පහසුකම් සංවර්ධනය වීම නිසා ව්‍යාපාර කටයුතු පහසු වීම.**

මුල්‍ය ප්‍රතිපත්තිය

රටේ මුදල් සැපයුම් පාලනය කිරීම සඳහා රජය අනුගමනය කරන ප්‍රතිපත්තියයි.

මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ දේශීය අර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි.

රජය වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනුයේ මහා බැංකුව විසිනි.

මුදල් සැපයුම පාලනයට යොදා ගන්නා උපකරණ

1. **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය**
   වාණිජ බැංකුවල පවතින තැම්පතු ප්‍රමාණයට සාපේක්ෂව මහ බැංකුවේ පවත්වා ගතයුතු තැම්පතු ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයයි. සංචිත අවශ්‍යතාව අඩු කිරීම මගින් මුදල් සැපයුම ඉහළ යන අතර සංචිත අවශ්‍යතාව වැඩි කිරීම තුළින් මුදල් සැපයුම අඩු වේ.

2. **විවට වෙළඳපල කටයුතු**
   මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු විවට වෙළඳපල කටයුතු ලෙස හැදින්වේ. මහ බැංකුව විසින් සුරකුම්පත් අලෙවි කිරීමේදී මුදල් සැපයුම අඩු වන අතර සුරකුම්පත් නැවත මිලදී ගැනීමේදී මුදල් සැපයුම වැඩිවේ.

3. <u>පොළී අනුපාතය</u>

මුදල් සැපයුම පාලනයේදී යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය පොළී අනුපාතයයි. මෙය ප්‍රධාන කොටස් 3කින් යුක්ත ය.

නිත්‍ය තැම්පතු පහසුකම් අනුපාතය (SDFR)	නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR)	බැංකු පොළී අනුපාතය
වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් තම අරමුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොළී අනුපාතයයි.	වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේදී අය කරනු ලබන පොළී අනුපාතයයි.	ද්‍රවශීල දුෂ්කරතා වලදී මහ බැංකුව විසින් වාණිජ බැංකු වලට අවසාන ණය දෙන්නා වශයෙන් සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොළී අනුපාතයයි.

ඉහත පොළී අනුපාතයන් ඉහළ දැමීම මගින් මුදල් සැපයුම සංකෝචනය වන අතර පොළී අනුපාත පහළ දැමීම තුළින් මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

4. <u>වට්ටම් අනුපාතය</u>

මහා බැංකුව විසින් නිකුත් කල සුරැකුම්පත් ඒවා කල්පිරීමට ප්‍රථම වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේදී අය කරන අනුපාතයයි.

5. <u>ණය සීමා පැනවීම</u>

මෙය ප්‍රධාන ආකාර දෙකකට සිදු කරයි.

A. ගුණාත්මක ණය සීමා පැනවීම

ආර්ථිකයේ ණය ගලා යන දිශාව පාලනය කිරීම මෙහිදී සිදු වන අතර තෝරා ගත් අංශ සඳහා ණය ගලා යාම ධෛර්යමත් කිරීමත් අධෛර්යමත් කල යුතු අංශ සඳහා ණය ගලා යාම සීමා කිරීමත් සිදු කරයි.

ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම, ණයවරලිපි මත කාසි ආන්තික දැක්වීම, අක්‍රිය ණය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දැක්වීම උදාහරණ වේ.

B. ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම

රටේ සමස්ත මුදල් සැපයුමට බලපාන පරිදි බැංකු ණය ප්‍රමාණය අඩු වැඩි කරමින් සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීම මෙහිදී සිදු වේ.

ණය සඳහා උපරිම පරිණත කාල නියම කිරීම, උපරිම ණය සීමා පැනවීම, වාණිජ බැංකු වල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාතය නියම කිරීම, ණයවරලිපි නිකුත් කිරීමේදී තැන්පත් කල යුතු අවම මුදල් ප්‍රමාණය තීරණය කිරීම මීට උදාහරණ වේ.

<u>පාරිභෝගික ආරක්ෂණය</u>

තම පරිභෝජනය සදහා භාණ්ඩ හා සේවා මිලදී ගන්නා පුද්ගලයා ''පාරිභෝගිකයා'' ලෙස හදුන්වයි.

- <u>''පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබා දීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය'' පාරිභෝගික ආරක්ෂණය ලෙස හදුන්වයි.</u>

<u>වර්තමානයේ පාරිභෝගික ආරක්ෂණය වඩා වැදගත් වීමට හේතු</u>

- වෙළඳපල තුළ භාණ්ඩ හා සේවා බහුල වීම.
- වෙළඳපල සංකීර්ණ වීම (ගෝලීයකරණය, නිදහස් වෙළඳාම ආදිය නිසා)
- පාරිභෝගික දැනුම ප්‍රමාණවත් නොවීම.
- පාරිභෝගික සංවිධාන ප්‍රමාණවත් නොවීම හා ශක්තිමත් නොවීම.
- වෙළෙඳුන් විසින් සිදු කරන විෂමාචාර ක්‍රියා බහුල වීම.
- එකම වුවමනාව සදහා භාණ්ඩ වර්ග රාශියක් වෙළඳපලෙහි පැවතීම.

පාරිභෝගික ආරක්ෂණයේ වාසි / වැදගත්කම

පාරිභෝගිකයාට	නිෂ්පාදකයාට
• වෙළඳ විෂමාචාර වලින් ආරක්ෂා වීමට. • ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලැබෙන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම. • තම සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු වීම. • අවශ්‍ය අවස්ථා වල නීතිමය රැකවරණය ලබා ගැනීමට. • පාරිභෝගිකයාට ජීවත් වීමට හිතකර පරිසරයක් බිහි වීම. • පාරිභෝගික අධ්‍යාපනය ඉහළ යාම.	• පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම. • ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම. • ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතේ යෑම් සහ නාස්තිය අවම වීම. • යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම. • පාරිභෝගික පැමිණිලි හා නීතිමය ක්‍රියාමාර්ග අවම කර ගත හැකිවීම. • පාරිභෝගික තෘප්තිය ඉහළ යාම හා පාරිභෝගික සබඳතා තර වීම.

<u>පාරිභෝගික වගකීම්</u>

1. විචාරාත්මක දැනුවත්භාවය
   භාණ්ඩ හා සේවාවන්හි මිල, ගුණත්වය, වෙනත් වැදගත් තොරතුරු පිලිබඳ ව ප්‍රශ්න කිරීම, සෝදිසි කිරීම, විමසිලිමත් වීම පාරිභෝගිකයා විසින් සිදු කල යුතුය.
2. ක්‍රියාකාරී සහභාගිත්වය
   යුක්තිසහගත සාධාරණ ගනුදෙනු සහ පාරිභෝගික අයිතිවාසිකම් රැක ගැනීමට ක්‍රියාකාරීව කටයුතු කල යුතු බව
3. සමාජය ගැන සැලකිලිමත් වීම
   තම පාරිභෝජන රටාව වෙනත් පුද්ගල හා සමාජ කණ්ඩායම් වලට ඇති කරන බලපෑම් ගැන දනුවත්භාවයෙන් කටයුතු කිරීම.
4. පාරිසරික දනුවත්බව
   තම පරිභෝජන රටාව හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම පිලිබඳ අවධානය යොමු කිරීම.
5. සහයෝගිතාව
   පාරිභෝගික අයිතිවාසිකම් ලබා ගැනීමට සහ රැක ගැනීමට සියලු පාරිභෝගිකයන් එක්ව කටයුතු කල යුතු බව.

<u>පාරිභෝගික අයිතිවාසිකම්</u>

දැනට පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් **8**ක් පවතින අතර ඉන් **4**ක් ඇමරිකානු හිටපු ජනපති ජෝන්.එෆ්. කෙනඩි විසින්ද, අනෙක් **4** පාරිභෝගික ජාත්‍යන්තරය විසින්ද ඉදිරිපත් කර ඇත.

1. තෝරා ගැනීමට ඇති අයිතිය
   තරඟකාරී මිල ගණන් යටතේ උසස් ප්‍රමිතීන්ගෙන් යුත් භාණ්ඩ සේවා තෝරා ගැනීමට අයිතියක් ඇති බව මින් අදහස් කරයි. පාරිභෝගිකයා ගෙවන මුදලට සැබෑ වටිනාකමක් ලබා ගැනීමට ක්‍රියා කිරීම මේ ඔස්සේ අවධාරණය කරයි.

2. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
   නැණවත් තෝරා ගැනීමක් සඳහා ඉවහල් වන සත්‍ය තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය.

3. ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය.
   තම සෞඛ්‍යට හා ජීවිතයට හානියක් විය හැකි භාණ්ඩ සේවා ඔස්සේ සිදුවන හානිදායක තත්වයන්ගෙන් ආරක්ෂා වීමට ඇති අයිතිය මෙමඟින් අවධාරණය කරයි.

4. සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය.
   රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේදී පාරිභෝගික ආරක්ෂණයට අදාළව බලධාරීන්ගේ සානුකම්පිත සැලකිල්ල යොමුකරවා ගැනීමට පාරිභෝගිකයාට අයිතියක් ඇත.

5. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය.
   මිනිසාට අත්‍යවශ්‍ය ආහාරපාන, අඳුම් පැළඳුම්, නිවාස, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ලබා ගැනීමට ඇති අයිතිය මෙමඟින් තහවුරු කරයි.

6. වන්දි ලබා ගැනීමට ඇති අයිතිය.
   වෙළඳ විෂමාචාර හේතුවෙන් පාරිභෝගිකයාට ඇති වන හානිකර තත්වයන් වෙනුවෙන් වන්දි ලබා ගැනීමට අයිතියක් ඇති බව මෙමගින් දැක්වේ.

7. පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය.
   නැණවත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා අත්පත් කර ගැනීමට ඇති අයිතියයි.

8. සුවදායක පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.
   තම ජීවිතයට අනතුරුදායක හෝ තර්ජනාත්මක නොවන පරිසරයක ජීවත් වීමට හා රැකියාවක් කිරීමට ඇති අයිතිය මින් අදහස් කරයි.

"උපරිම තෘප්තියක් හා ඉහළ ගුණත්වයක් ඇති භාණ්ඩ මිලදී ගැනීම පාරිභෝගිකයෙකුගේ අපේක්ශාවයි" මෙය ඉටු කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ලෙස,

- උසස් ප්‍රමිති හා තත්වයන්ගෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම.
- ප්‍රකට සන්නම් නාම සහ වෙළඳ ලකුණු සහිත භාණ්ඩ මිලදී ගැනීම.
- ලේබලය හොඳින් පරීක්ෂාකර භාණ්ඩ මිලදී ගැනීම.
- විශ්වාසවන්ත වෙළඳසැල් වලින් භාණ්ඩ මිලදී ගැනීම.
- වගකීම් සහිත භාණ්ඩ ඉල්ලා සිටීම.

ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන ආයතන

1. පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය
2. ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය
3. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
4. මධ්‍යම පරිසර අධිකාරිය
5. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
6. පළාත් පාලන ආයතන
7. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේඛම් කාර්යාල

පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය

පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම හා සාධාරණ වෙළඳපල ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ප්‍රධාන බලධාරී ආයතනයයි.

අරමුණු	කාර්යයන්
• පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපල වලට උපද්‍රවයක් සිදු වන භාණ්ඩ හා සේවා අලෙවියට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම. • අසාධාරණ වෙළඳ පිලිවෙත් වලට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම. • වෙළෙඳුන් විසින් සිදු කරන පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහනයක් ලබා දීම. • හැකි සෑම විටම පාරිභෝගිකයාට තරඟකාරී මිලට භාණ්ඩ හා සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම. • පාරිභෝගික අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම.	• ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය හෝ ඉවත් කිරීම. • තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ව අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම. • ඵලදායි තරඟය පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම. • දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිලිබඳ අවහිරතා නැති කිරීම. • පාරිභෝගික අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම. • පාරිභෝගික සංවිධාන පිහිටුවීම හා ප්‍රවර්ධනය කිරීම

පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය ව්‍යාපාර වලට වැදගත් වන ආකාරය

1. අධිකාරිය නියම කර ඇති ප්‍රමිතීන්ට කටයුතු කිරීම නිසා නාස්තිය අවම වීම.
2. පාරිභෝගික විශ්වාසය තහවුරු වීම.
3. ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
4. ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදුවන නෛතික තත්වයන් අවම වීම.
5. ව්‍යාපාර අතර ඇතිවන අනවශ්‍ය තරඟකාරිත්වය අවම වීම.
6. සාධාරණව තරඟ කල හැකි වීම.

පාරිභෝගික කටයුතු පිලිබඳ සභාව

පාරිභෝගිකයන් විසින් අධිකාරියට සිදු කරනු ලබන පැමිණිලි සහ ව්‍යාපාරිකයන් විසීන් සිදු කරන විෂමාචාර විමර්ශනය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනනයි. මෙය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතය.

2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරි පනත ක්‍රියාත්මක කිරීමත් සමග සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත, මිල පාලන පනත සහ පරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත අහෝසි කෙරිණි.

පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරි පනතේ සඳහන් වන වෙළෙඳුන් විසින් සිදු කිරීමට ඉඩ ඇති වැරදි

- භාණ්ඩයේ සදහන් උපරිම මිලට වඩා වැඩි මිලකට භාණ්ඩ විකිණීම.
- ලේබල් හෝ විස්තර වෙනස් කිරීම.
- අවශ්‍යතාවට වඩා වැඩියෙන් භාණ්ඩ තොග රැස් කර තබා ගැනීම.
- භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම.
- භාණ්ඩයේ මිල ලේබල් කිරීම පැහැර හැරීම.

පාරිභෝගික ජාත්‍යන්තරය

ලෝකයේ රටවල් 115 ක පමණ පාරිභෝගික සංගම් 228 කින් යුක්ත අන්තර්ජාතික සංවිධානයකි. ලොව වෙසෙන සියලු පාරිභෝගිකයන්ගේ අයිතීන් රැක ගැනීම පිණිස මෙය ක්‍රියාත්මක වෙයි. 1960 දී අන්තර්ජාතික පාරිභෝගික සමිති සම්මේලනය නමින් ආරම්භ කල අතර 1995 සිට "පාරිභෝගික ජාත්‍යන්තරය" ලෙස හඳුන්වයි. මෙහි ප්‍රධාන කාර්යාලය එංගලන්තයේ ලන්ඩන්හි පිහිටා ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය

නිෂ්පාදන කටයුතු උසස් මට්ටමක පවත්වාගෙන යාමත්, ඒවා දියුණු කිරීමත්, පිරිවැය අවම කිරීමත් සඳහා ජාතික අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් ප්‍රමිති පද්ධතියක් සකසා පවත්වාගෙන යාමේ අරමුණු පෙරදැරි කරගෙන 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිත ආයතන පනත යටතේ පිහිටුවා ඇත.

අරමුණු	කාර්යයන්
• නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිලිබදව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිත පිළියෙළ කිරීම. • කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතකරණය සහා තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම. • දේශීය මෙන්ම ආනයනික භාණ්ඩ ප්‍රමිතීන්ට අනුකුලදැයි යන්න පරික්ෂා කිරීම. • ප්‍රමිතකරණය සහ තත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම. • ප්‍රමිත සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.	• ප්‍රමිත පිළියෙළ කිරීම. • ප්‍රමිත ක්‍රියාත්මක කිරීම • ප්‍රමිතකරණය සහ තත්ව පාලනය පිලිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම. • ප්‍රමිතකරණය සහ තත්ව පාලනය ප්‍රවර්ධන කටයුතු • උපකරණ ක්‍රමාංකන සේවා, තොරතුරු සේවා සහ පුස්තකාල සේවා • පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම. • තත්ව පද්ධති පිලිබඳ අන්තර්ජාතික ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.

ප්‍රමිති ආයතනය ව්‍යාපාර වලට වැදගත් වන ආකාරය

1. SLS ලකුණ සහිත නිෂ්පාදිත හරහා තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට හැකි වීම.
2. පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම.
3. විදේශීය ප්‍රමිති සහතික ලබා ගැනීම තුළින් විදේශ වෙළඳපලට පිවිසීමට හකි වීම.
4. ප්‍රමිතීන්ට අනුගත තම නිෂ්පාදිත සමබන්ධයෙන් ඇති පාරිභෝගික පිළිගැනීම ඉහළ යාම.
5. ප්‍රමිතකරණය තුළින් නාස්තිය අවම වී ඵලදායිතාව වර්ධනය වීම.
6. ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
7. රාජ්‍ය අංශය SLS සලකුණ සහිත භාණ්ඩ වලට ප්‍රමුඛත්වයක් දීම නිසා වෙළඳපල පුළුල් වීම.

ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය ප්‍රමිත ක්‍රියාත්මක කරන ආකාර

1. ස්වේච්ඡාවෙන්
2. ප්‍රමිති සහතික ලාංඡන ක්‍රමය මගින්
3. පූර්ව අපනයන පරික්ෂාව මගින්
4. පූර්ව ආනයන පරික්ෂාව මගින්
5. විදුලි උපකරණ ශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණය මගින්

ප්‍රමිතියක් යනු,

විද්‍යාවෙත්, තාක්ෂණයේත්, පලපුරුද්දෙත් ඒකාබද්ධ ප්‍රතිඵල පදනම් කරගෙන අදාළ සියලු අංශ වල පොදු අනුමැතිය හා ඒකමතිකභාවයෙන් පිළියෙළ කොට අන්තර්ජාතික, කලාපීය හෝ ජාතික මට්ටමෙන් පිළිගත්, ජාතික මට්ටමෙන් අනුමත කර මහජනයා වෙත නිකුත් කරන තාක්ෂණික පිළිවිතරයකි.

<u>සහතික ලාංඡන</u>

1. **SLS (SRI LANKA STANDARDS)**
   ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයේ ප්‍රමිතින්ට අනුව භාණ්ඩ නිෂ්පාදනය කොට ඇති බවට සහතික වෙමින් SLS සහතිකය ලබාදෙයි.

   SLS ලබා ගැනීමේ වාසි

නිෂ්පාදකයාට	පාරිභෝගිකයාට
• විධිමත් ප්‍රමිතකරණයක් සහ තත්ව පාලනයක් පවත්වා ගත හැකිවීම. • නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි වීම. • නාස්තිය අවම වීම. • ප්‍රචාරණ කටයුතු වලදී වාසියක් වීම. • රජයේ ආයතන මිලදී ගැනුම් වලදී විශේෂත්වයක් දැක්වීම. • පාරිභෝගික විශ්වාසය වැඩි වීම. • කීර්තිනාමය ඉහළ යාම.	• භාණ්ඩ විශ්වාසදායක ලෙස තෝරා ගත හැකි වීම. • ගෙවන මුදලට උපරිම තෘප්තියක් ලැබෙන බවට සහතිකයක් වීම. • නිෂ්පාදන පිරිවැය අඩු වීම නිසා භාණ්ඩ වල මිල ගණන් අඩු වීම. • ගැටලුකාරී තත්වයකදී නීතිමය ආවරණ ලබා ගත හැකි වීම. • ජාතික ප්‍රමිතියට අනුව නිපදවා ඇති බවට තෙවන පාර්ශ්ව සහතිකයක් ලැබීම.

2. **ISO 2008 -** තත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය
3. **ISO 14001 -** පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණය
4. **ISO 22000 -** ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණය
5. **HACCP -** උපද්‍රව විශ්ලේෂණ හා අවධි පාලන අවස්ථා සහතිකකරණය
6. **OHAS 18001 -** වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතා කළමනාකරණ පද්ධති සහතිකකරණය
7. **SA8000 -** සමාජ වගවීම් සහතිකකරණය
8. **GMP -** යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකකරණය